**කතරගම ප්‍රාදේශීය සභාව**

**මොණරාගල දිස්ත්‍රික්කය**

**--------------------------**

1. **<u>මූල්‍ය ප්‍රකාශන</u>**

1.1 **<u>මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම</u>**

සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන 2014 ජූලි 30 වැනි දිනද, ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2013 දෙසැම්බර් 02 වැනි දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපති වාර්තාව 2014 ඔක්තෝබර් 09 දින සභාවේ සභාපතිවරයා වෙත යවන ලදී.

1.2 **<u>මතය</u>**

සභාපතිවරයා වෙත යවන ලද මාගේ වාර්තාවේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2013 දෙසැම්බර් 31 දිනට කතරගම ප්‍රාදේශිය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 **<u>මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම</u>**

1.3.1 **<u>ගිණුම්කරණ අඩුපාඩු</u>**

(අ) සමාලෝචිත වර්ෂයේ දී මිලදීගෙන තිබූ රු.88,500 ක් වටිනා ඇගිලි සලකුණු යන්ත්‍රය ස්ථාවර වත්කම් යටතේ ගිණුම්ගත කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ ආරම්භයට ලැබිය යුතු වැටුප් ප්‍රතිපූර්ණ රු.113,000 ක් සමාලෝචිත වර්ෂයේ ලැබී තිබුණද, ලැබිය යුතු වැටුප් ප්‍රතිපූර්ණ ගිණුමට ගැලපීම් කර නොතිබුණි.

(ඇ) සභාව සතු පුස්තකාලයේ මිල නොකළ පොත් 800 ක වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂය අවසානයට ගෙවිය යුතු රු. 103,122 ක වියදම් වෙනුවෙන් ගිණුම්වල ප්‍රතිපාදන සලස්වා නොතිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂය අවසානයට මූල්‍ය ප්‍රකාශන අනුව ණයහිමි ශේෂය රු. 2,750,865 ක් වූ අතර, ණයහිමි ලේඛනය අනුව රු.2,577,196 ක් වුයෙන් රු. 173,669 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ඊ) සමාලෝචිත වර්ෂය අවසානයට සකස් කර තිබූ මූල්‍ය හා මෙහෙයුම් පිළිබඳ ප්‍රකාශයේ මුළු මෙහෙයුම් අයභාරය රු.41,390,148 ක් වුවද, රු.41,350,148 ක්

සදොස් ලෙස සඳහන් කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ඌණතාවය රු. 40,000 ක් වැඩියෙන් පෙන්නුම් කර තිබුණි.

(උ) සමාලෝචිත වර්ෂයේ දී ඇසල උත්සවය සඳහා තාවකාලික වැසිකිලි ඉදිකිරීම සඳහා මිලට ගත් රු. 200,848 ක ද්‍රව්‍ය තොග ලේඛනවලට ඇතුලත් කර ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඌ) සමාලෝචිත වර්ෂය අවසානයට ගෙවිය යුතු රු.14,594 ක පළාත් පාලන විශ්‍රාම වැටුප් දායක මුදල සඳහා ගිණුම්වල ප්‍රතිපාදන සලසා නොතිබුණි.

(එ) පසුගිය වර්ෂයන් සඳහා ගෙවිය යුතු රු. 302,657 ක විගණන ගාස්තු හා සමාලෝචිත වර්ෂය සඳහා ගෙවිය යුතු විගණන ගාස්තු වෙනුවෙන් ගිණුමෙහි ප්‍රතිපාදන සලසා නොතිබුණි.

1.3.2 <u>නොසැසඳු පාලන ගිණුම්</u>

ගිණුම් විෂයන් 05 කට අදාළව මූල්‍ය ප්‍රකාශණ අනුව ශේෂයන්ගේ එකතුව රු.42,766,798 ක් වූ අතර, ලේඛන අනුව ශේෂය රු.43,654,715 ක් විය.

1.3.3 <u>අවිනිශ්චිත ගිණුම</u>

සමාලෝචිත වර්ෂය අවසානයට මූල්‍ය තත්ත්වය පිළිබඳව ප්‍රකාශයේ හර ශේෂයේ වෙනස වූ රු.16,971 ක් අවිනිශ්චිත ගිණුමකට හරකර තිබුණි.

1.3.4 <u>විගණනය සඳහා සාක්ෂි නොවීම.</u>

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.14,410,680 ක් වූ වත්කම් විෂයන් 06 ක් විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

1.3.5 <u>නීති, රීති හා රෙගුලාසි ආදියට අනුකූල නොවීම.</u>

පහත දැක්වෙන නීති,රීති හා රෙගුලාසි විධි විධානවලට අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

| <u>නීති,රීති රෙගුලාසි වලට යොමුව</u> | <u>අනුකූල නොවීම</u> |
|---|---|
| (අ) **<u>1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත</u>** | |
| 158 හා 159 වගන්ති | සමාලෝචිත වර්ෂය අවසානයට එකතුව රු.35,806,268 ක් වු හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. |

(ආ) <u>ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි</u>

| | |
|---|---|
| මු.රෙ 1646 | සමාලෝචිත වර්ෂයේ ට්‍රැක්ටර් හා බවුසර් වෙනුවෙන් රු.1,732,318 ක ඉන්ධන භාවිතා කර තිබුණද, දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ විගණකාධිපති වෙත යැවීමට කටයුතු කර නොතිබුණි. |

(ඇ) <u>ශ්‍රී ලංකා ජනරජයේ ආයතන සංග්‍රහය</u>

| | |
|---|---|
| XXIV පරිච්ඡේදයේ 1.6 හා 4 වගන්තිය. | සභාවේ සේවය කර සේවය හැර ගිය, ස්ථාන මාරු වී ගිය, මිය ගිය නිලධාරීන් 12 දෙනෙකුගෙන් අයකර ගත යුතු රු.18,400 ක සේවක ණය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. |

1.3.6 <u>ප්‍රමාණවත් අධිකාරි බලයකින් ආවරණය නොවූ ගණුදෙනු</u>

පසුගිය වර්ෂයේ අවසානයට දැන්වීම් පුවරු වෙනුවෙන් ලැබිය යුතු රු.29,465 ක මුදල සමාලෝචිත වර්ෂයේදී කපා හැර තිබුණමුත්, ඒ සඳහා පළාත් පාලන කොමසාරිස්වරයාගේ අනුමැතිය ලබාගෙන නොතිබුණි.

2. <u>මූල්‍ය සමාලෝචනය</u>

2.1 <u>මූල්‍ය ප්‍රතිඵලය</u>

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ ආදායම ඉක්ම වූ පුනරාවර්තන වියදම රු.129,795 ක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 3,305,728 ක් වුයෙන් මූල්‍ය ප්‍රතිඵලයේ ශුද්ධ අඩුවීම රු. 3,435,523 ක් විය.

2.2 <u>ආදායම් පරිපාලනය</u>

2.2.1 <u>වරිපනම් බදු</u>

1987 අංක 15 දරන ප්‍රාදේශිය සභා පනතේ 140 (5) පරිදි 1997 වර්ෂයෙන් පසු වරිපනම් ගාස්තු ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි.

2.2.2 <u>බදු කුලී</u>

1987 අංක 15 දරන ප්‍රාදේශිය සභා පනතේ 136 වගන්තිය ප්‍රකාරව කඩ කාමර කුලී තක්සේරු දෙපාර්තමේන්තුවෙන් තක්සේරු කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

2.2.3 <u>වෙනත් ආදායම්</u>

(අ) 2013 ඇසල උත්සවය පැවැත්වෙන කාල සීමාව තුල වෙළඳ ස්ථාන ඉදිකිරීම සඳහා බිම් කට්ටි බදු දීමේදී අඩු ආදායම්ලාභින් සඳහා සද්ධාතිස්ස මාවතේ රු. 15,000 බැගින් අංක 19 සිට අංක 28 දක්වා බිම් කට්ටි 10 ක් ලබා දී තිබුණමුත්, මෙම අඩු ආදායම්ලාභින්ට ලබා දී තිබූ බිම් කට්ටි ඔවුන් විසින් ඉහළ මුදලකට වෙනත් පාර්ශවයන්ට ලබාදී තිබූ බව 2013 අගෝස්තු 15 දින කරන ලද ක්ෂේත්‍ර පරික්ෂණයේදි අනාවරණය විය.

(ආ) සභාව විසින් තාවකාලික වෙළඳ ස්ථාන ඉදිකිරීම සඳහා බිම් කට්ටි බදුදීම සඳහා මිළ ගණන් කැඳවීමෙන් පසු මිළ ගණන් ඉදිරිපත් නොවූ බිම් කට්ටි වෙන්දේසි කිරිමට කටයුතු කිරීමෙන් පසු ඉතිරිවන බිම් කොටස් සඳහා විධිමත් පරිදි ඒවා ලබාදීමට වැඩ පිළිවෙලක් සකස් කර නොතිබූ අතර, එසේ මිළ ගණන් ඉදිරිපත් නොවූ හා වෙන්දේසියෙන් ලබාගත් බිම් කට්ටි සභා තීරණ මත රු. 5,000 බැගින් ලබාදීමට තීරණය කර තිබුණි. එසේ ලබා දුන් බිම් කැබලි වැඩි මුදලකට වෙනත් පාර්ශවයන්ට ලබාදී තිබූ බව 2013 අගෝස්තු 15 දින කරන ලද ක්ෂේත්‍ර පරීක්ෂාවේදී අනාවරණය විය.

(ඇ) සභාව මඟින් රුහුණු මහා කතරගම දේවාලයේ 2013 ඇසල උත්සවයේ අනුග්‍රාහක හවතුන් සඳහා වෙළඳකුටි හා කොඩි සවි කිරීමට ස්ථාන ලබා දී තිබුණද , එම අනුග්‍රාහකයින්ගෙන් සභාවට අයවිය යුතු ගාස්තු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) අතුරු ව්‍යවස්ථාවන් සම්මත කර නොගෙන එක් ත්‍රිරෝද රථ හිමියෙකුගෙන් වර්ෂයකට රු.250 බැඟින් රථගාල් කිරීමේ ගාස්තු අය කරගෙන තිබුණි.

(ඉ) 1987 අංක 15 දරන ප්‍රාදේශිය සභා පනතේ 149 වගන්තිය ප්‍රකාර 1968 අංක 14 දරන සංචාරක සංවර්ධන පනතේ කාර්යයන් සඳහා ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන මණ්ඩලයේ ලියාපදිංචි කර ඇති හෝ එම මණ්ඩලය අනුමත කර ඇති ප්‍රාදේශිය සභා බල ප්‍රදේශයේ තිබෙන හෝටල් / ලැගුම්හල් 06 කින් අදාළ වර්ෂයට පෙර වර්ෂයේ ආදායමින් 1 % ක් නොඉක්මවන ගාස්තුවක් අතුරු ව්‍යවස්ථා පනවා අය කිරිමට කටයුතු කර නොතිබුණි.

2.2.4 <u>උසාවි දඩ</u>

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ උසාවි දඩ මුදල් රු. 1,500,000 ක් විය.

3. <u>මෙහෙයුම් සමාලෝචනය</u>

3.1 <u>මෙහෙයුම් අකාර්යක්ෂමතා</u>

(අ) 2012 හා 2013 වර්ෂවලදී සමීක්ෂණයට ඉදිරිපත් නොවූ රු.151,582 ක් වටිනා පුස්තකාල පොත් 1898 ක් සම්බන්ධයෙන් අවශ්‍ය කටයුතු සිදුකර නොතිබුණි.

(ආ) පසුගිය වර්ෂයේ අවස්ථා 04 කදී සේවකයන්ට ලබා දුන් වටිනාකම රු.59,064 ක අත්තිකාරම් පියවා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) විදුලිබල අමාත්‍යාංශ ලේකම්ගේ 2010 අගෝස්තු 17 දිනැති ලිපියේ 2.1 වගන්තිය ප්‍රකාරව වීථි ලාම්පු ක්‍රියාත්මක කිරීම හා නඩත්තු කිරීම සඳහා ගාස්තු ගෙවීමේ පදනම මත පළාත් පාලන ආයතන වීථි පහන් ක්‍රියාත්මක කිරීම හා නඩත්තු කිරීම සඳහා සේවා සැපයුම්කරුවෙකු ලෙස කටයුතු කළ යුතු වුවත්, එසේ සිදු නොකර සමාලෝචිත වර්ෂයේදී මේ සඳහා සභා අරමුදලෙන් රු.85,258 ක් වියදම් දරා තිබූ අතර, වීථි ලාම්පු ස්ථාපනය කිරීමේදී ස්ථාපන ක්‍රමය, සවි කළ යුතු ලාම්පු වර්ගය, සංඛ්‍යාව යනාදිය පිළිබඳව මෙම ලිපිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ඈ) 2011 හා 2012 වර්ෂ සඳහා ගෙවිය යුතු රු. 467,877 ක ඇසල උත්සව දිරි දීමනා නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) කතරගම ඇසල උත්සව කටයුතු සඳහා ප්‍රාදේශිය සභා මඟින් 2012, 2013 වර්ෂවලදී තාවකාලික කම්කරුවන් බඳවාගෙන ඒ සඳහා රු.2,994,395 ක මුදලක් ගෙවීම් කර තිබුණි. ඇසල උත්සවය සඳහා කම්කරුවන් යොදන ස්ථාන, එම ස්ථාන සඳහා කම්කරුවන්ගේ අවශ්‍යතාවය, කම්කරුවන් සේවයේ යෙදවීම සඳහා සේවා මුර සකස් කිරීම, සේවයට යොදන කම්කරුවන් නියමිත පරිදි යොදා ඇති කාලය තුල සේවය කරන බවට අධීක්ෂණ ක්‍රියාවලියක් සකස් කිරීම, ඒ ඒ කාර්යයන් සඳහා ඒවායේ වැදගත්කම හා අවශ්‍යතාවය මත යොදා ගන්නා කම්කරුවන් ප්‍රමාණය ආදිය ඇතුලත් සැලැස්මක් සකස් කිරීම, තාවකාලික බඳවා ගත් කම්කරුවන් සඳහා අංක සහිත තාවකාලික හැඳුනුම්පතක් නිකුත් කිරීම ආදිය සිදු නොකිරීම නිසා වැයකරන ලද මුදල ඵලදායි ආකාරයට යෙදවුයේද යන්න විගණනයේ දී තහවුරු නොවිය.

(ඊ) ධම්මරක්ඛිත මාවතේ පිහිටි සභාව සතු නිවාස 04 ක් සම්බන්ධයෙන් සභාව විසින් නඩත්තු කටයුතු නොකිරීම, අනවසර පදිංචිකරුවන් ඉවත් කිරීම හා නියමිත පරිදි කුලී අය කිරීම ආදිය සිදු කර නොතිබුණි.

3.2 **<u>හඳුනාගත් අලාභ</u>**

(අ) සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදලට දායක මුදල් ගෙවීමේදී ආකෘති පත්‍ර II වාර්තාව ප්‍රමාද වී යැවීම නිසා 2005 සිට 2011 වර්ෂය දක්වා කාල පරිච්ඡේදයට අදාලව රු. 99,156 ක මුදලක් සමාලෝචිත වර්ෂයේදී අධිභාර වශයෙන් ගෙවා තිබුණි.

(ආ) 2011 අප්‍රේල් 19 වන දින සිට 2014 ජනවාරි 03 දින දක්වා රථගාල් 07 ක් සඳහා ලබා දී තිබු රු. 40 හා රු. 60 ආදායම් කුවිතාන්සි පොත් 24 කට අදාල රු. 248,000 ක ආදායම් හා අදාල කුවිතාන්සි පොත්වල උප පත්‍රිකා සභාවට ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.

4. **<u>ගිණුම් කටයුතු භාවය හා යහ පාලනය</u>**

**<u>අයවැය පාලනය</u>**

සමාලෝචිත වර්ෂය වෙනුවෙන් සභාව විසින් පිළියෙල කර තිබූ අයවැය ලේඛනය මඟින් ඇස්තමේන්තු කළ ආදායම්, වියදම් හා වර්ෂයේ තථ්‍ය ආදායම්, වියදම් අතර පෙන්නුම් කෙරෙන සැලකිය යුතු විචලනයන් අනුව ආදායම් හා වියදම් පාලනයේදී අයවැය ලේඛනය ඵලදායි පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණි.

5. **<u>පද්ධති හා පාලන</u>**

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර වි ශේෂ කෙරෙහි අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) අභ්‍යන්තර පාලනය

(ඇ) ආදායම් පරිපාලනය